**අනුරාධපුර මහා නගර සභාව - 2022**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අනුරාධපුර මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ හා කරත්ත රු.4,069,569 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු නමුත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.4,802,626 ක් ලෙස රු.733,055 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගලිරථ සේවා ගාස්තු රු.334,400 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළ රු.24,740,979 ක මුද්දර ගාස්තු ආදායමක් සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි. | මුද්දර ගාස්තු කිනම් වර්ෂයකට අදාළ දැයි නිවැරදිව හඳුනාගැනීමේ අපහසුතාවය නිසා ලැබෙන නිර්දේශිත වටිනාකම සමාලෝචිත වර්ෂයට අදාළ වටිනාකම සේ සලකා ගිණුම්ගත කර ඇති බව. | මුද්දර ගාස්තු අදාළ වන වර්ෂය තහවුරු කරගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු කර ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයට අදාළව තහවුරු කරන ලද රු.19,000 ක මුද්දර ගාස්තුව පමණක් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂය තුළ ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තුගත පදනම අනුව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට සිදුකරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය අනුව ප්‍රත්‍යාගණිත ලාභය රු.34,491,648 ක් වුවත් එය රු.4,802,626 ක් ලෙස රු.29,689,022 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණිත වත්කම් වලට අදාළ වන සමුච්චිත ක්ෂය රු.30,828,378 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයෙන් ඉවත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ආරම්භක ශේෂ ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |
| (උ) | 2021 වර්ෂයේදී මාර්ග හා ඉදිකිරීම් වත්කම් වැඩිවීම් රු.19,357,320 කට අදාළ වන සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ වෙනුවෙන් රු.1,935,732 ක ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ආරම්භක ශේෂ ගැලපීම් මගින් ක්ෂය වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ක්ෂයවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද රු.37,886,022 ක ගොඩනැගිලි ඉදිකිරීම් මාර්ග හා ඉදිකිරීම් යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ආරම්භක ශේෂ ගැලපීම් මගින් මෙම වත්කම් ශේෂය ඉඩම් ගොඩනැගිලි හා මාර්ග ඉදිකිරීම් වශයෙන් වෙන වෙනම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි ඉදිකිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී රු.27,459,612 ක මාර්ග හා ඉදිකිරීම් සිදුකර තිබුණු නමුත් එය රු.84,702,954 ක් ලෙස රු.57,243,342 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | සටහන් අංක 16 - ලෙජර් ගිණුම් නිවැරදි කර ඉදිරිපත් කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී දේපළ, පිරියත හා උපකරණ මිලදීගැනීම වෙනුවෙන් රු.29,423,745 ක් ගෙවා තිබුණු නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.92,964,797 ක් ලෙස රු.63,541,052 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂය තුළ ආධාර ලැබීම ලෙස නිවැරදි විය යුතු බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | 2021 වර්ෂයට අදාළව හඳුනාගත යුතු සූර්ය කෝෂ පද්ධතියට අදාළ රු.2,174,710 ක ආදායම සමුච්චිත අරමුදලට නොගලපා සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සමාලෝචිත වර්ෂයට අදාළ නොවන ආදායම් සමුච්චිත අරමුදලට ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | සූර්ය කෝෂ පද්ධතියෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.1,149,681 ක ආදායමක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ආරම්භක ශේෂ නිවැරදි කිරීම මගින් අදාළ ගැලපීම් සිදුකරන බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | පොදු වෙළඳසැල සූර්ය කෝෂ පද්ධතියට අදාළව සමාලෝචිත වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.30,372 ක ආදායමක් ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | 2013-2019 කාලපරිච්ඡේදයේදී රු.46,847,572 ක පරිත්‍යාග ලැබීම් සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉකුත් වර්ෂවලට අදාළ ගනුදෙනු සමුච්චිත අරමුදලට ගැලපිය යුතුය. |
| (ජ) | 2020 සහ 2021 වර්ෂවලදී LDSP ව්‍යාපෘතිය යටතේ රු.15,385,590 ක මුදල් ලැබීම් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනාගෙන නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ච) | 2020 සහ 2021 වර්ෂවලට අදාළ වන සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කළ රු.46,816,932 ක මාර්ග, බෝක්කු, මංමාවත් සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.4,681,693 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ආරම්භක ශේෂ තුළ අදාළ ශේෂ තුළ අදාළ නිවැරදි කිරීම් සිදුකරන බව. | ක්ෂයවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඡ) | සභාව විසින් ලබාගත් ණය වර්ග 05 ක 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.35,256,890 ක් වන අතර ඒ තුළ වූ වසරකට අඩු කාලයකින් ගෙවිය යුතු රු.15,656,623 ක ණය ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජංගම වගකීම් හා දිගුකාලීන වගකීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ට) | 2015 – 2016 වර්ෂවලදී උතුරු මැද පළාත් සභාවෙන් ලැබී තිබුණු වටිනාකම රු.9,850,000 ක්වූ කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රය හා කසල උඳුන දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | දේපළ, පිරියත හා උපකරණ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ද) | ජංගම ගිණුම් 05 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකුවේ තැන්පත් කළ නමුත් මාස 06 ක් ඉක්මවා තිබියදීත් උපලබ්ධි නොවූ වටිනාකම රු.2,437,722 ක් වූ චෙක්පත් | 2023 අගෝස්තු 31 දිනට පෙර ගැලපීම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

65 ක් සම්බන්ධයෙන් අදාළ ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ලැබිය යුතු ගලි රථ සේවා ආදායම උපලේඛනය අනුව රු.1,144,000 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය අනුව එය රු.364,100 ක් වීම නිසා රු.779,900 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | අනුරූපී වාර්තා උපලේඛන සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | වත්කම් සහ වගකීම් ප්‍රකාශයට අනුව 2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ රු.14,660,012 ක් වුවත් එදිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය රු.14,389,322 ක් වුයෙන් රු.270,690 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ගැලපුම් ලෙස දක්වා තිබූ රු.35,673,375 ක ශේෂය කුමක්ද යන්න පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | විස්තර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය බැංකු ජංගම ගිණුම් 06 කට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.24,420,802 ක හඳුනානොගත් හර සටහන් සහ රු.12,730,391 ක හඳුනානොගත් බැර සටහන් පැවතුණි. ඒ තුළ වර්ෂ ගණනාවක සිට පැවත එන වටිනාකම් ඇතුළත් වූ අතර ඒ සම්බන්ධ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වියදම් වර්ගීකරණ සටහන මෙ සමඟ ඉදිරිපත් කරන බව. | විස්තීරණ ආදායම් ප්‍රකාශන වියදම් වර්ගීකරණ සහිතව ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ.396 (ඇ) | ජංගම ගිණුම් 05 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබූ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ වටිනාකම රු.8,818,360 ක්වූ චෙක්පත් 48 ක් සම්බන්ධයෙන් අදාළ ගිණුම්වල ගැලපීම් සිදුකර නොතිබුණි. | මේ වනවිට මු.රෙ 396(ඇ) අනුව කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර බැංකු සැසඳුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයෙහි අංක 2 (iv) ඡේදය | ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණි සහ පිට වූ වේලාවන් සනාථ කර නොගෙන අවස්ථා 08 කදී රු.90,710 ක අතිකාල ගෙවීම් කර තිබුණි. | දැනට නිවැරදි කර ක්‍රියාත්මක කර ඇති බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ii) | 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008(vi) චක්‍රලේඛය | නාගරික කොමසාරිස්වරයාට මාසිකව හිමි ඉන්ධන දීමනාව වන ලීටර් 135 ක් ඉක්මවා වටිනාකම රු.357,920 ක් වූ ඉන්ධන ලීටර් 1216.1 ක් 2022 වර්ෂයේදී ලබාදී තිබුණි. | ඉන්ධන ලීටර් ප්‍රමාණය වැඩිකර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබාදී ඇත. | ලිඛිත අනුමැතියක් ලබාගත් ලිපියක් ඉදිරිපත් කර නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.34,570,337 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.46,807,371 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022<br>------<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021<br>------<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 119,962,000 | 78,121,540 | 79,929,199 | 110,918,319 | 108,256,000 | 77,094,050 | 60,469,287 | 112,725,978 |
| (ii) | කුලී | 82,273,038 | 78,236,585 | 67,730,749 | 69,056,120 | 106,080,000 | 36,763,000 | 53,410,265 | 58,550,284 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 32,413,000 | 29,192,086 | 36,658,002 | 6,255,379 | 204,293,000 | 56,670,902 | 61,306,331 | 13,721,295 |
| (iv) | වෙනත් ආදායම් | 94,265,600 | 122,695,556 | 119,149,240 | 27,831,062 | 47,309,000 | 15,377,985 | 29,177,135 | 24,284,746 |
| | | 328,913,638 | 308,245,767 | 303,467,190 | 214,060,880 | 465,938,000 | 185,905,937 | 204,363,018 | 209,282,303 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 2022 වර්ෂය සඳහා රු.76,960,000 ක වරිපනම් ආදායමක් රැස් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වනවිට රු.30,972,323 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය සියයට 40 ක තරම් පහල මට්ටමක පැවතුණි. | රටේ පැවති ආර්ථික සෞඛ්‍ය හා දේශපාලන හේතුන්ගේ බලපෑමක් ඇති වූ බව. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | නව ඉදිකිරීම් හෝ වෙනස්වීම් වලට ගැලපෙන පරිදි වර්ෂ 05 කට වරක් දේපළ තක්සේරු කළයුතු වුවත් 2009 වර්ෂයේ තක්සේරුව අනුව 2022 වර්ෂය සඳහාද වරිපනම් අයකරමින් පැවතුණි. | නව තක්සේරු කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට ඉල්ලීම් යොමුකර ඇති බව. | නව තක්සේරු ලබාගැනීම් කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | මහා නගර සභා ආඥා පනතේ 252(1)(අ) වගන්තිය ප්‍රකාරව රු.110,918,319 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වර්ෂ 01 සිට වර්ෂ 10 ඉක්ම වූ කාලයක සිට කටයුතු කර නොතිබුණි. | රටේ පැවති ආර්ථික, සෞඛ්‍ය හා දේශපාලන තත්ත්වයක් මත නීත්‍යානුකූල ක්‍රමවේද ක්‍රියාත්මක කර නොමැති බව සහ අවසන් නිවේදන පමණක් නිකුත් කර ඇති බව. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (iv) | මහා නගර සභා බල ප්‍රදේශයේ කසළ ලබාදෙන ව්‍යාපාර ආයතන 33 කින් වසර 01 - 03 ක් අතර කාලයක සිට අයවිය යුතු කසල බදු රු.2,859,199 ක් 2022 දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කසළ බදු අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | මහා නගර සභාව සතු කඩ කාමර වසර 05 කට වරක් තක්සේරු කළයුතු වුවත් පොදු වෙළඳසැල අදියර I හා අදියර II කඩ කාමර සහ අනෙකුත් කඩ කාමර සඳහා 1999 තක්සේරුව පදනම් කරගෙන කුලී අයකරමින් පැවතුණි. | නව තක්සේරු වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 අවසන් කාර්තුවේ ලබා දී ඇති බව. | නව තක්සේරු වටිනාකම් අනුව හිඟ කුලී අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ii) | කඩ කාමර බදුදීම වෙනුවෙන් වසර 01 ත් 08 ත් අතර කාලයක සිට අයනොවී පවතින හිඟ කුලී රු.61,623,610 ක් 2022 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබුණි. | අධිකරණය තින්දු ලබා ගැනීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව. | අධිකරණය තීන්දු ප්‍රකාරව හිඟ කුලී අය කර ගත යුතුය. |
| (iii) | වත්කම් බදුදීම වෙනුවෙන් අයවිය යුතු හිඟ කුලී රු.1,694,554ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | වත්කම් බදුදීම් හිඟ කුලී අය කර ගත යුතුය. |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | මහා නගර සභා ආඥා පනතේ 247 අ (2) වගන්තිය ප්‍රකාරව හා 2021 දෙසැම්බර් 24 දිනැති අංක 2260 දරන අනුරාධපුර මහා නගර සභාවේ ගැසට් නිවේදනය ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හොටෙල්වල ආදායමින් සියයට 01 ක ගාස්තුවක් අයකරගත යුතු වේ. එසේම 2005 අංක 38 දරන සංචාරක පනතේ 61(1) වගන්තිය ප්‍රකාරව සංචාරක මධ්‍යස්ථාන අනිවාර්යෙන්ම ලියාපදිංචි වී ගිණුම් ඉදිරිපත් කළයුතු ආයතන 33 ක් වෙතින් එම සියයට 1 ක ගාස්තු අයකර ගැනිමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. | සංචාරක ව්‍යාපාරයේ පැවති ආදායම් පහළ යාම නිසා දැඩි නීති,රීති පනවා අයකිරීම නොකරන ලෙස වූ ඉල්ලීම් අනුව කටයුතු කර ඇති බව. | ලබාගෙන ඇති ආදායම මත පමණක් පදනම්ව බලපත්‍ර ගාස්තු අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2021 දෙසැම්බර් 24 දිනැති අනුරාධපුර මහා නගර සභාවේ අංක 2260 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා පෞද්ගලික රෝහල් 05 කින් රු.200,000 ක්ද රසායනාගාර 09 කින් රු.45,000 ක්ද අයකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | 2021 දෙසැම්බර් 24 දිනැති අංක 2260 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ගිණි ආරක්ෂණ සේවා ගාස්තු කාණ්ඩ 33 ක් යටතේ රු.600, රු.2,500, රු.10,000 සහ රු.15,000 බැගින්වූ රේටයන් අනුව අයකළ යුතු වුවත් මහනගර සභා බල ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාරවලින් එලෙස කාණ්ඩ ගතකර ගාස්තු අයකර නොතිබුණි. එම නිසා රු.5,000,000 ඉක්මවූ වාර්ෂික ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | -එම- | ගැසට් නිවේදනය ප්‍රකාරව අය කර ගත යුතුය. |
| (iv) | සභා බල ප්‍රදේශයේ බලපත්‍ර ලබාගත යුතු ආයතන මගින් වෙළඳ බලපත්‍ර ලබා නොගැනිම නිසා වසර 01 ත් 03 ත් අතර කාලපරිච්ඡේදයක සිට රු.4,719,139 ක් අයවී නොතිබුණි. | -එම- | හිඟ වෙළඳ බලපත්‍ර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි 2020-2022 කාලයට අදාළව අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.1,536,240 ක් 2022 දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණි. | -එම- | හිඟ දැන්වීම් පුවරු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| | **උසාවි දඩ** | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට රු.1,475,079 ක උසාවි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 34 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2022 දෙසැම්බර් 31 දින වනවිට පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. | අදහස් දක්වා නොමැත. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සභිකවරියක් භාරයේ පැවති වටිනාකම රු.94,500 ක් වූ පොත් කට්ටල 88 ක් විනාශ වී තිබුණු නමුත් එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නෛතික ක්‍රියාමාර්ග සඳහා යොමුකර ඇත බව. | අලාභය අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කළ දහයියාගම මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා නගර සභාවේ සේවකයින් සහ යන්ත්‍ර විධිමත් ගිවිසුමකින් තොරව ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ලබාදී තිබුණු අතර එම මුදල් ගෙවීම පැහැරහැරීම නිසා සභාවට රු.255,228 ක අලාභයක් සිදුවී තිබුණි. | ගාස්තු ලබාදෙන ලෙස ඉල්ලීම ගොනුකර ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර මහා නගර සභාවට අයත් නිල නිවාසයක් ලෙස පැවති අංක 07 නිල නිවස සහ එම ඉඩම වසර 50 කට අධික කාලයක සිට පෞද්ගලික රෝහලක් හා විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් ලෙස පවත්වාගෙන යාම සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු නමුත් ඒ සම්බන්ධව විධිමත් ගිවිසුමක් ඇති කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. එමෙන්ම මේ සඳහා 2021 වර්ෂයේදී සිදුකරන ලද නව තක්සේරු වටිනාකම් අනුව අයවිය යුතු රු.9,189,171 ක හිඟ කුලී 2022 අගෝස්තු 31 දිනට අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ කුලී අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉහත සඳහන් නිල නිවාසය රෝහලක් බවට පරිවර්තනය කිරීම නිල නිවාසයේ ඉදිකිරීම් වෙනස් කිරීම්, වැඩි දියුණු කිරීම් වසර 50 ක කාලයක සිට සිදුවී තිබුණු අතර ඒ සඳහා මහා නගර සභාවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතුය. |
| (ඇ) | අනුරාධපුර මහා නගර සභාවට අයත් ප්‍රමාණය අක්කර 30.75ක්වූ ඉඩම් 28ක එළදා බදුදීම සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුම් ඇතිකර ගැනීමටත් ලේඛන යාවත්කාලීන කිරීමටත් හිඟ බදුකුලී රු.245,000 ක් අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මැනුම් කටයුතු සිදුකර, බදු ගිවිසුම් යාවත්කාලීන කර හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් කිරික්කුලම පිහිටි කසළ මධ්‍යස්ථානය තුළ නිපදවන කාබනික පොහොර පෞද්ගලික ආයතනයකින් ලබා ගත් ව්‍යාජ විස්තර සඳහන් කරන ලද ඇසුරුම් තුළ කිලෝග්‍රෑම් 40 බැගින් ඇසුරුම් කරන ලද කාබනික පොහොර කිලෝග්‍රෑම් 54000 ක් ගබඩාකර තිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5** වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තු සභාවට ලබාදී තිබුණු වටිනාකම රු.710,000 ක්වූ කසළ කැබලි කිරීමේ යන්ත්‍රද ප්‍රයෝජනයට නොගෙන නිසල නිමින පරිශ්‍රයේ නිශ්කාර්ය පැවතුණි. | අදහස් දක්වා නොමැත. | යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6** ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කරන ලද සභිකයින් රු.175,750 ක වැඩිපුර දීමනා ගෙවීමක් සිදු වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | කමිටු රැස්වීම් ප්‍රමාණය අනුව පමණක් දීමනා ගෙවීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය -25 ප්‍රකාරව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදුකරන ප්‍රසම්පාදනයන් සඳහා දීමනා හිමි නොවන නමුත් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදුකරන ලද ප්‍රසම්පාදන 71 ක් වෙනුවෙන් රු.345,500 ක දීමනා ගෙවා තිබුණි. | -එම- | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 අනුව ක්‍රියාකළයුතු වේ. |
| (ඇ) | පුරවර උදානය - 2022 සඳහා ලංසු කැඳවීමේදී ලංසු සුරක්ෂණයක් නොගැනීම සහ ප්‍රවේශ පත්‍ර නිවැරදිව ගණනය නොකිරීම නිසා අනුරාධපුර මහා නගර සභාවට රු.3,765,100 ක ආදායමක් අහිමිවී තිබුණි. | -එම- | අලාභය වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂය සඳහා අනුරාධපුර මහජන පොළ රු.5,500,000 කට බදුදී තිබුණු අතර බදුකරු විසින් පොළ ආපසු සභාවට භාරදී තිබුණි. එම නිසා සතිපොල සඳහා නැවත ලංසු කැඳවීමක් නොකිරීම නිසා මහා නගර සභාවට රු.2,563,415 ක පාඩුවක් සිදුවී තිබුණි. | -එම- | -එම- |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 224 ක් පැවති අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 226 ක් සිටින බවද නිරීක්ෂණය විය. අතිරික්ත කාර්ය මණ්ඩලය තුළ අනියම් කාර්ය මණ්ඩලය 182 ක් ද, කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් 18 දෙනෙකුද දෛනික වැටුප මත බඳවාගත් සේවකයන් 26 දෙනෙකුද විය. | අදහස් දක්වා නොමැත. | අනියම් සේවකයින්ගේ පත්වීම් විධිමත් කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**3.8 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ පුරවර උදානය පැවති දින 06 ක කාලය තුළදී රාත්‍රි කාලයේ ප්‍රවේශපත්‍ර පරීක්ෂා කළ සේවකයින් වෙත රු.2,500 බැගින් දීමනාවක්ද නාගරික කොමසාරිස්, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන | අදහස් දක්වා නොමැත. | දීමනා ගෙවීම් කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |

නිලධාරීන් තිදෙනාට ඔවුන්ගේ වැටුපෙන් සියයට 75 ක ලෙස රු.152,160 ක දීමනාවක් මහා නගර සභාව විසින් ගෙවා තිබුණු නමුත් ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අනුරාධපුර මහා නගර සීමා තුළ සිදුකරන ලද අනවසර ඉදිකිරීම් හේතුවෙන් විශාල පරිසර හානියක් සිදුවී තිබුණු නමුත් එම පරිසර බලපෑම පිළිබඳව අනුරාධපුර මහා නගර සභාව විසින් නිසි අවධානයක් යොමුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතුය. |